ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU3337- පූර්ව ප්‍රාථමික සහ ප්‍රාථමික ඉගැන්වීමේ සමෝධානිත පිවිසුම.**

කාලය - පැය දෙකයි. (02)

දිනය - 2025.05.31 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## I - වන කොටස

01. "සමෝධානික ප්‍රවේශය" යන පදය අර්ථ දක්වන්න.

02. ප්‍රාථමික අධ්‍යාපනයේදී සමෝධානික ප්‍රවේශය වැදගත් වන්නේ ඇයි?.

03. සමෝධානික ප්‍රවේශයක ලක්ෂණ මොනවාද? පිළිතුරෙහි අවම වශයෙන් ලක්ෂණ හතරක් (04) සඳහන් විය යුතුය.

04. පෙරපාසල් මට්ටම සඳහා සමෝධානික විෂයමාලාවක් සකස් කිරීමේදී සළකා බැලිය යුතු සාධක හතරක් (04) සඳහන් කරන්න.

05. "දරුවෙකුගේ පූර්ණ සංවර්ධනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

06. ප්‍රාථමික පාසල් දරුවන්ට සමෝධානික අධ්‍යාපන ප්‍රවේශයකින් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

07. ඉන්දියාවේ සමෝධානික ප්‍රවේශය ක්‍රියාත්මක කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ප්‍රාථමික පන්ති කාමරයක සමෝධානික ප්‍රවේශයක් සඳහා මාතෘකාවන් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක මොනවාද?

(ලකුණු 05 X 08 =40)



71

## II- වන කොටස

09. I. පෙරපාසල් අධ්‍යාපනය තුළ ළමා සංවර්ධනය සඳහා සමෝධානික ප්‍රවේශයේ දායකත්වය උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. පෙරපාසල් සහ ප්‍රාථමික පාසල් සැකසුම් අතර ළමා සංවර්ධනය සඳහා සමෝධානික ප්‍රවේශයක දායකත්වය වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 10)

10. I. 3 ශ්‍රේණිය සිසුන් සඳහා සැලසුම් කර ඇති "අප පරිහරණය කරන දේ." යන තේමාව මත පදනම් වූ සමෝධානික ප්‍රවේශයක් සඳහා සංකල්ප සිතියමක් නිර්මාණය කරන්න . (ලකුණු 05)

II. ඔබේ සංකල්ප සිතියම මත පදනම් ව, "අප පරිහරණය කරන දේ" තේමාව යටතේ සවිස්තරාත්මක පාඩම් සැලැස්මක් සකස් කරන්න. පහත ආකෘතිය භාවිතා කරන්න. (ලකුණු 15)

පාඩම් සැලැස්මේ ආකෘතිය.

- විෂයය :- පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්
- ශ්‍රේණිය :- 3
- තේමාව :- අප පරිහරණය කරන දේ
- කාලසීමාව :-

ඉගෙනුම් ඵල (i) ........................

(ii) ........................

(iii) ........................

| දවස සහ දිනය | ඉගෙනුම් ඵල | ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ | ගුරුවරයන්ගේ සහභාගීත්වය | සිසු සහභාගීත්වය | තක්සේරු කිරීම සහ ඇගයීම | කාලය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

11. I. සමෝධානික විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ප්‍රධාන ගැටළු සහ අභියෝග පහක් (05) හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 05)

II. සමෝධානික විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරුන්ගේ භූමිකාවන් පහක් (05) ලැයිස්තු ගත කර, එක් එක් භූමිකාව උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

III. පන්තිකාමරය තුළ සමෝධානික ඉගෙනුම් ප්‍රවේශයේ යෙදීමට පහත සාධක බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

(i) පන්ති කාමර ඝනත්වය (classroom density)

(ii) පුද්ගල වෙනස්කම් (02 X 05 = ලකුණු 10)

12. I. විෂයපාදක ප්‍රවේශය සහ සමෝධානික ප්‍රවේශය අතර වෙනස කුමක්ද? (ලකුණු 05)

II. ශ්‍රී ලංකාවේ නිපුණතාපාදක විෂයමාලාව, ඉගෙන ගන්නන්ගේ සමස්ත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර සමෝධානික කිරීම අරමුණු කරගෙන ඇත. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? අදාළ උදාහරණ සමඟ ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 15)

13. I. පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් යන දෙකෙහිම සමෝධානික විෂයමාලාවක් සඳහා සංකල්ප සිතියම් නිරූපණය කරන්න. (ලකුණු 08)

II. 1972 සිට පන්ති කාමරය තුළ සමෝධානික ප්‍රවේශයේ සිදුවී ඇති වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 12)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*